## සංශෝධනයයි

## නැගෙනහිර පළාත් සභාව
## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

ඉහත සඳහන් බඳවා ගැනීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් මස 14 වැනි සිකුරාදා ''දිනමිණ'' පුවත්පතේ 33 වැනි පිටුවෙහි පළ කරන ලද දැන්වීම හා නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීම පිළිබඳවයි.

නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීමෙහි ඡේද අංක 9.1 පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

9.1 විභාග ගාස්තුව රු. 300/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

බදුල්ල, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර, මාතලේ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් තම විභාග ගාස්තු ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නමට ලියු මුදල් ඇණවුමක් මඟින් පමණක් එවිය යුතුයි. ගෙවන කාර්යාලය ත්‍රිකුණාමලය ලෙස සඳහන් කළ යුතුයි.

එම්.වයි.සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
ත්‍රිකුණාමලය.

**නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි සහ සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් සහ 2.2 ඡේදයෙහි සඳහන් කර ඇති විෂයයන් සඳහා බදුල්ල, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර, මාතලේ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයක ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන්ද අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2019.01.04** දින වේ. මෙම විභාගය, ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකි තරම් ආසන්න දිනක, නැගෙනහිර පළාතේ නගර හතරකදී, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**01. යෝග්‍යතා ඃ-**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

1.1.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2 යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

1.1.3 **2019.01.04** වන දිනට වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **40** ට නොවැඩි විය යුතුය.

1.1.4 (අ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන වසර තුනක් (03) අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

**හෝ**

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් වසර තුනක් (03) අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි ස්ථිරව පදිංචි වී සිටින අයෙකු සමඟ ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර මෙම පළාතට පැමිණ පදිංචි වී ඒ බව සනාථ කළ හැකි ලේඛන ඉදිරිපත් කළ හැකි අයෙකු වීම.

1.1.5 නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අපේක්ෂකයින්ට අමතරව පහත 2.2 හි සඳහන් කොන්දේසි යටතේ බදුල්ල, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර, මාතලේ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයක අවම වශයෙන් වසර තුනක් (03) ස්ථිර පදිංචි උපාධිධාරීන්ටද මේ සඳහා අයදුම්පත් යොමු කළ හැකිය.

සටහනඃ **ඉහත 1.1.4(අ) සහ 1.1.5 යටතේ අයදුම්කරන අපේක්ෂකයින් පදිංචිය සනාථ කිරීමට ආසන්න වසර 03 ක් සඳහා ලබාගත් ඡන්දහිමි නාමලේඛනයේ සහතික කරන ලද උපුටනය සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු අතර, ඉහත 1.1.4(ආ) යටතේ අයදුම්කරන අපේක්ෂකයින් තමාගේ පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය සහ තම කලත්‍රයාගේ පදිංචිය සනාථ කිරීමට ආසන්න වසර 03 ක් සඳහා ලබාගත් ඡන්දහිමි නාමලේඛනයේ සහතික කරන ලද උපුටනය සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකයද සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.**

**1.2 අධ්‍යාපන සුදුසුකම්**

1.2.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව **2019.01.04** වන දිනට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමනු ලබන ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළ උපාධියක් ලබා තිබීම.

**සහ**

1.2.2 අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

**02. බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි ඃ-**

2.1 දැනට ගුරු සේවයේ නියුතු වූවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලබන අතර, එසේ ඉල්ලුම් කිරීම වරදක් සේ සලකනු ලැබේ.

2.2 සිංහල මාධ්‍ය පාසල්වලට සහ සිංහල මාධ්‍ය පාසල්වල ද්විභාෂාවෙන් (සිංහල හා ඉංග්‍රීසි) විද්‍යාව, ගණිතය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) යන විෂයයන් සඳහා නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අපේක්ෂකයින්ට අමතරව බදුල්ල, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර, මාතලේ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයක ස්ථිර පදිංචි උපාධිධාරීන්ටද අයදුම්පත් ඉදිරිපත් කළ හැක. නමුත් මෙම අයදුම්කරුවන් සඳහා 1.1.4 හි සඳහන් කර ඇති කොන්දේසි අදාල නොවන අතර, බඳවා ගැනීමේ දී පහත සඳහන් අනුපිළිවෙළ අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

1. දිස්ත්‍රික්කය තුල ස්ථිරව පදිංචි වී සිටින උපාධිධාරීන්.
2. නැගෙනහිර පළාතෙහි ස්ථිරව පදිංචි වී සිටින උපාධිධාරීන්.
3. ඉහත 1.1.4(ආ) අනුව වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණ පදිංචිව සිටින උපාධිධාරීන්.
4. බදුල්ල, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර, මාතලේ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ස්ථිර පදිංචි උපාධිධාරීන්.

2.3 මෙම දැන්වීමට අදාළව පුරප්පාඩු පවතින විෂයයන් සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ. මෙම ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන්ගෙන් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලබන පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.) සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සුදුසුකම් සනාථ කරනු ලබන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ලිඛිත තරග විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

2.4 බඳවා ගැනීමේදී අයදුම්කරුවෙකුගේ නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය පළමුව සලකා බැලේ. එම දිස්ත්‍රික්කයේ පුරප්පාඩු සම්පූර්ණයෙන් පිරවීමෙන් පසු අයදුම්කරු විසින් ඉල්ලුම් කර ඇති විෂයය/විෂයයන්ට අදාලව වෙනත් දිස්ත්‍රික්කයන්හි පුරප්පාඩු පවතී නම් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති **'අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක'** යන කොටසෙහි සඳහන් දිස්ත්‍රික්කයන්ගේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පත්වීම් ලබාදීමට සලකා බලනු ලැබේ. පිට පළාත්වලින් අයදුම්කරන අපේක්ෂකයින්ට අයදුම්පත්‍රයෙහි සඳහන් **'අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක'** යන කොටසෙහි සඳහන් දිස්ත්‍රික්ක අනුපිළිවෙල අනුව පත්වීම් ලබාදීමට සලකා බලනු ලැබේ.

2.5 **උපලේඛනය 01** : පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක සහ විෂයයන් පහත දැක්වේ.

| විෂයය අංකය | විෂයය | දිස්ත්‍රික්කය සහ මාධ්‍ය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ත්‍රිකුණාමලය | | මඩකලපුව | අම්පාර | | |
| | | සිංහල | ද්විභාෂාවෙන් දෙ /ඉ | ද්විභාෂාවෙන් දෙ /ඉ | සිංහල | ද්විභාෂාවෙන් දෙ /ඉ | ද්විභාෂාවෙන් සි /ඉ |
| 01 | විද්‍යාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 02 | ගණිතය | ✓ | --- | --- | ✓ | --- | --- |
| 03 | දෙවන භාෂාව (දෙමළ) | --- | --- | --- | ✓ | --- | --- |
| 04 | චිත්‍ර කලාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 05 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | ✓ | --- | --- | ✓ | --- | --- |
| 06 | පුස්තකාල විද්‍යාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 07 | සිංහල භාෂාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 08 | ඉතිහාසය සහ පුරවැසි අධ්‍යාපනය | ✓ | --- | --- | ✓ | --- | --- |
| 09 | භූගෝල විද්‍යාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 10 | ගිණුම්කරණය | ✓ | --- | --- | --- | --- | --- |
| 11 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 12 | ඉංජිනේරු තාක්ෂණවේදය | ✓ | --- | --- | ✓ | --- | --- |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 13 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | ✓ | --- | --- | ✓ | --- | --- |
| 14 | පෙරදිග සංගීතය | --- | --- | --- | ✓ | --- | --- |
| 15 | නර්තනය (දේශීය) | ✓ | --- | --- | ✓ | --- | --- |
| 16 | උපදේශණය හා මඟපෙන්වීම | ✓ | --- | --- | ✓ | --- | --- |
| 17 | ප්‍රාථමික | ✓ | --- | --- | ✓ | --- | --- |
| 18 | කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | ✓ | --- | --- | ✓ | --- | --- |
| 19 | ගෘහ ආර්ථික විද්‍යාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 20 | නාට්‍ය හා රංග කලාව | ✓ | --- | --- | ✓ | --- | --- |
| 21 | සිංහල සාහිත්‍යය | --- | --- | --- | ✓ | --- | --- |
| 22 | විද්‍යාව ද්විභාෂාවෙන්<br>(දෙමළ - ඉංග්‍රීසි / සිංහල - ඉංග්‍රීසි) | --- | --- | ✓(*) | --- | ✓(*) | ✓(**) |
| 23 | ගණිතය ද්විභාෂාවෙන්<br>(දෙමළ - ඉංග්‍රීසි / සිංහල - ඉංග්‍රීසි) | --- | ✓(*) | ✓(*) | --- | ✓(*) | ✓(**) |
| 24 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) ද්විභාෂාවෙන්<br>(දෙමළ - ඉංග්‍රීසි / සිංහල - ඉංග්‍රීසි) | --- | ✓(*) | ✓(*) | --- | ✓(*) | ✓(**) |
| 25 | භූගෝල විද්‍යාව ද්විභාෂාවෙන්<br>(දෙමළ - ඉංග්‍රීසි / සිංහල - ඉංග්‍රීසි) | --- | ✓(*) | ✓(*) | --- | ✓(*) | ✓(**) |
| 26 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ද්විභාෂාවෙන්<br>(දෙමළ - ඉංග්‍රීසි / සිංහල - ඉංග්‍රීසි) | --- | ✓(*) | ✓(*) | --- | ✓(*) | ✓(**) |
| 27 | ව්‍යවසායකත්ව අධ්‍යාපනය ද්විභාෂාවෙන්<br>(සිංහල - ඉංග්‍රීසි) | --- | --- | --- | --- | --- | ✓(**) |
| 28 | ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය ද්විභාෂාවෙන් (දෙමළ - ඉංග්‍රීසි) | --- | --- | --- | --- | ✓(*) | --- |

**සටහන 1 : '✓' ලකුණ පුරප්පාඩු පවතී යන්නත්, '---' ලකුණ පුරප්පාඩු නොමැත යන්නත් අර්ථවත් වේ.**

**සටහන 2 : '✓(*)' ලකුණ දෙමළ පාසල්වල පවතින පුරප්පාඩු යන්නත්, '✓(**)' ලකුණ සිංහල පාසල්වල පවතින පුරප්පාඩු යන්නත් අර්ථවත් වේ.**

**සටහන 3 : දෙ /ඉ : ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි)**
**සි/ඉ : ද්විභාෂාවෙන් (සිංහල හා ඉංග්‍රීසි)**

2.6 අයදුම්කරනු ලබන විෂයය කිසිසේත්ම වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳවද සලකා බලනු නොලැබේ.

2.7 මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ දිස්ත්‍රික් පදනම මත වන බැවින්, වසර 10 ක් ගත වනතුරු ස්ථාන මාරු සඳහා සලකා බලනු නොලැබේ. මේ පිළිබඳව සේවා ගිවිසුමක් නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ඇති කර ගැනීමට එකඟ විය යුතුය.

2.8 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් පනවා ඇති කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද, යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 03/2016 අනුව වන අතර මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය G.E.-1-2016 දරණ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු. 27,740-300x6-380x7-445x2 රු. 33,090/- වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.

2.9 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය. අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.10 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංකඃ 1885/38, දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත. එමෙන්ම මෙම නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

2.11 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

3.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 5.3 සිට 11.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

3.2 දෘශ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතු පාටින් **''දෘෂ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි''** යනුවෙන් සඳහන් කළ යුතුය.

3.3 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

3.4 උපලේඛන 02 යටතේ සඳහන් විෂයයන් සඳහා අවශ්‍ය වන අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර, ඔබගේ උපාධියට අදාල විෂයයන් සඳහා පමණක් අයදුම්පත් යොමු කළ යුතු වේ. විෂයයන් කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතු අතර, වෙන් වෙන් වශයෙන් විභාග ගාස්තුද ගෙවා එක් එක් අයදුම්පතෙහි නියමිත ස්ථානයෙහි නොගැලවෙන සේ අලවා වෙන වෙනම ලිපිකවරවල බහා එවිය යුතුය. එක් එක් විෂයයන් සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු නොකර, එක් අයදුම්පතක අයදුම්කර තිබුණහොත් හෝ රිසිට්පත වෙන වෙනම නියමිත ස්ථානයෙහි අලවා නොතිබුණහොත් එවැනි අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.5 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

3.6 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2019.01.04** වන දිනට හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.**(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංකඃ 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය.

3.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **EX/Rec/18/08** යන්න සඳහන් කළ යුතුය.

**04. විභාගයට පෙනී සිටීම ඃ-**

4.1 අයදුම්පත් ඉදිරිපත් කරන ලද, මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන්ට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4.2 අපේක්ෂකයා, තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම තම ප්‍රවේශ පත්‍රයෙහි අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම තමාට නියමිත ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන්

පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයාට සිදුවනු ඇත.

සටහන - **අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, නියමිත සුදුසුකම් සපුරා නොගෙන විභාගවලට ඉදිරිපත් වීම වරදක් සේ සලකනු ලැබේ.**

## 05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

## 06. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

## 07. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය ඃ-

මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එහිදී සිංහල මාධ්‍ය සහ සිංහල මාධ්‍ය පාසල්වල ද්විභාෂා ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් සිංහල මාධ්‍යයෙන්ද, දෙමළ මාධ්‍ය පාසල්වල ද්විභාෂා ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් දෙමළ මාධ්‍යයෙන්ද, විභාගයට ඉදිරිපත් විය යුතු වේ.

## 08. විෂයය නිර්දේශය ඃ-

### 8.1 ලිඛිත විභාගය

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්නපත්‍ර සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ. විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුවේ.

**01. අභියෝග්‍යතාවය -** කාලය පැය 01 යි (ලකුණු 100 යි)

අපේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

**02. සාමාන්‍ය දැනුම -** කාලය පැය 01 යි (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා /හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

### 8.2 ප්‍රායෝගික පරීක්ෂණය

8.2.1 සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05 ක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

8.2.2 දෙවන භාෂාව (දෙමළ) විෂයය සඳහා අයදුම් කර ඇති අයදුම්කරුවන් පමණක් එම විෂයය සඳහා විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර, ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතුය.

8.2.3 ද්විභාෂාවෙන් ගුරු පුරප්පාඩු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් තම ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.

| *ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (i) අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | 05 | 02 |
| (ii) පෞරුෂය හා පරිපාලනය | 05 | 02 |
| (iii) සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| (iv) කාල කළමනාකරණය | 05 | 02 |
| (v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම | 05 | 02 |
| ***මුළු ලකුණු ප්‍රමාණය*** | ***25*** | ***10*** |

**09.** විභාග ගාස්තු ඃ-

9.1 විභාග ගාස්තුව රු. 300/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

9.2 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යවනු ලබන අතර, www.ep.gov.lk වෙබ් අඩවියේද ප්‍රසිද්ධ කරනු ඇත.

**10.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| <u>නගරය</u> | <u>නගර අංකය</u> | <u>නගරය</u> | <u>නගර අංකය</u> |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 01 | අම්පාර | 03 |
| මඩකලපුව | 02 | කල්මුණේ | 04 |

**සැ.යු. යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

**11.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**12.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**13.** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතියද, යම් විශේෂ හේතුවක් මත විභාගය නොපැවැත්වීමට සිදුවුවහොත් ඒ පිළිබඳව අවසාන තීරණයද, කිසියම් පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳවද, උපාධියක වලංගුභාවය සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය ද, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි එහි ලේකම්වරයා සතු වේ.

<u>උපලේඛනය **02**</u>

| **විෂයය අංකය** | **මාධ්‍ය** | **විෂයය** | **අධ්‍යාපන සුදුසුකම්** |
|---|---|---|---|
| 01 | සිංහල | විද්‍යාව (Science) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජීව විද්‍යා උපාධියක් ලබා තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | | හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යා විෂයය ධාරාවට අදාළ විෂයයක් (ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව) ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් විද්‍යා උපාධියක් තිබීම. |
| 02 | සිංහල | ගණිතය<br>(Mathematics) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යා උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගණිතය ප්‍රධාන විෂයයක් (සංයුක්ත ගණිතය, ගණිතය, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හෝ භෞතික විද්‍යාව) ලෙස හදාරා ලබාගත් විද්‍යා උපාධියක් තිබීම. |
| 03 | සිංහල | දෙවන භාෂාව (දෙමළ) (Second Language – Tamil) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල මාධ්‍යයෙන් ලබාගත් උපාධියක් සමඟ අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවන භාෂාව (දෙමළ) විෂයය සඳහා අධි සම්මාන සාමාර්ථයක් (B) හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම හෝ දෙමළ භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් (C) හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ මාධ්‍යයෙන් ලබාගත් උපාධියක් සමඟ අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවන භාෂාව (සිංහල) විෂයය සඳහා අධි සම්මාන සාමාර්ථයක් (B) හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම හෝ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් (C) හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| 04 | සිංහල | චිත්‍ර කලාව<br>(Art) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් චිත්‍ර විෂයය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් චිත්‍ර විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 05 | සිංහල | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය<br>(ICT) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ |

| | | | |
|---|---|---|---|
| | | | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ ඕනෑම රජයේ පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අවම වශයෙන් අවුරුදු 02 ක ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 06 | සිංහල | පුස්තකාල විද්‍යාව<br>(Library in Scince) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ අවම වශයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් ප්‍රදානය කරනු ලබන පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන අදියර සමත් වී තිබීම. |
| 07 | සිංහල | සිංහල භාෂාව<br>(Sinhala Language) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල විෂයය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 08 | සිංහල | ඉතිහාසය සහ<br>පුරවැසි අධ්‍යාපනය<br>(History & Civic) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉතිහාසය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දේශපාලන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉතිහාසය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරා විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |

| | | | |
|---|---|---|---|
| 09 | සිංහල | භූගෝල විද්‍යාව (Geography) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 10 | සිංහල | ගිණුම්කරණය (Accounting) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වානිජවේදී (B.Com)/ ව්‍යාපාර පරිපාලනවේදී (BBA)/ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (B.Sc. Finance & Accounting) උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගිණුම්කරණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 11 | සිංහල | තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව (Science for Technology) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජීව විද්‍යා උපාධියක් හෝ භෞතික විද්‍යා උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තාක්ෂණවේදී වැනි ජෛව තාක්‍ෂණවේදය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂි තාක්‍ෂණය හෝ කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| 12 | සිංහල | ඉංජිනේරු තාක්‍ෂණවේදය (Engineering Technology) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ඉංජිනේරු විද්‍යාවේදී (BSc in Engineering) / ඉංජිනේරු උපාධියක් (Bachelor of Engineering) ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් (Civil) / විදුලි හා විද්‍යුත් (Electrical & Electronic) / මෝටර් රථ (Automobile) යන විෂයයන්ගෙන් එක් විෂයයක් ප්‍රධාන කොටසක් (Main area) ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තාක්‍ෂණවේදී වැනි තාක්ෂණික උපාධියක් ලබා තිබීම.<br><br>හෝ |

| | | | |
|---|---|---|---|
| | | | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (National Diploma in Technology (NDT)) ලබා තිබීම. |
| 13 | සිංහල | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය (Health and Physical Education) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ශාරීරික අධ්‍යාපනය / ක්‍රීඩා පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ශාරීරික අධ්‍යාපනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමඟ රජය විසින් පිළිගත් ආයතනයකින් ශාරීරික අධ්‍යාපනය / ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ උපාධිය ලබා ගැනීමට පෙර අවුරුදු 08 ක් තුල ජාතික මට්ටමේ කේවල ක්‍රීඩා ඉසව්වකින් ප්‍රථම ස්ථානය/දෙවන ස්ථානය/ තුන්වන ස්ථානය දිනා තිබීම හෝ පළාත් මට්ටමේ ක්‍රීඩා තරගයකින් ප්‍රථම ස්ථානය දිනා තිබීම හෝ අන්තර්ජාතික මට්ටමේ පිළිගත් ක්‍රීඩා තරඟාවලියක කේවල ක්‍රීඩා තරගයකට සහභාගී වී තිබීම. |
| 14 | සිංහල | පෙරදිග සංගීතය (Music – Oriental) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පෙරදිග සංගීතය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පෙරදිග සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ රජය විසින් පිළිගත් ආයතනයකින් අවම වශයෙන් අවුරුදු 02 ක් පෙරදිග සංගීතය හදාරා ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 15 | සිංහල | නර්තනය(දේශීය) (Dancing – Indigenous) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නර්තනය(දේශීය) පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නර්තනය(දේශීය) ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | | හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග රජය විසින් පිළිගත් ආයතනයකින් අවම වශයෙන් අවුරුදු 02 ක නර්තනය(දේශීය) හදාරා ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 16 | සිංහල | උපදේශණය හා මගපෙන්වීම<br>(Guidance and Counseling) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝ විද්‍යාව / සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග රජය විසින් පිළිගත් ආයතනයකින් අවම වශයෙන් අවුරුදු 02 ක උපදේශනය / මනෝ විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 17 | සිංහල | ප්‍රාථමික<br>(Primary) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කලා උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝ විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 18 | සිංහල | කෘෂිකර්මය හා ආහාර තාක්ෂණවේදය<br>(Agriculture and food Technology) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී (BSc in Food Science & Technology) උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී (BSc in Food Science & Nutrition) උපාධියක් ලබා තිබීම.<br><br>හෝ |

| | | | |
|---|---|---|---|
| | | | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (BSc in Food Science) උපාධියක් ලබා තිබීම. |
| 19 | සිංහල | ගෘහ ආර්ථික විද්‍යාව (Home Economics) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගෘහ විද්‍යාව / ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගෘහ විද්‍යාව / ගෘහ ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී (BSc in Food Science & Technology) උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී (BSc in Food Science & Nutrition) උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (BSc in Food Science) උපාධියක් ලබා තිබීම. |
| 20 | සිංහල | නාට්‍ය හා රංග කලාව (Drama and Theater) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 21 | සිංහල | සිංහල සාහිත්‍යය (Sinhala Literary) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල විෂයය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 22 | ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි / සිංහල හා ඉංග්‍රීසි) | විද්‍යාව (Science) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් ජීව විද්‍යා උපාධියක් තිබීම.<br><br>හෝ |

| | | | |
|---|---|---|---|
| | | | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යා විෂයය ධාරාවට අදාළ විෂයයක් (ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව) ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් විද්‍යා උපාධියක් තිබීම. |
| 23 | ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි / සිංහල හා ඉංග්‍රීසි) | ගණිතය (Mathematics) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් භෞතික විද්‍යා උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගණිතය ප්‍රධාන විෂයයක් (සංයුක්ත ගණිතය, ගණිතය, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හෝ භෞතික විද්‍යාව) ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් විද්‍යා උපාධියක් තිබීම. |
| 24 | ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි / සිංහල හා ඉංග්‍රීසි) | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් උපාධියක් සමග ඕනෑම රජයේ පිළිගත් ආයතනයකින් අවම වශයෙන් අවුරුදු 02 ක් පරිගණක විද්‍යාව හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හදාරා ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 25 | ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි / සිංහල හා ඉංග්‍රීසි) | භූගෝල විද්‍යාව (Geography) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් උපාධියක් තිබීම. |
| 26 | ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි / සිංහල හා ඉංග්‍රීසි) | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය (Health and Physical Education) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් ශාරීරික අධ්‍යාපනය / ක්‍රීඩා පිළිබඳ විශේෂ උපාධියක් තිබීම.<br>හෝ<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ශාරීරික අධ්‍යාපනය ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් උපාධියක් තිබීම.<br>හෝ |

| | | | |
|---|---|---|---|
| | | | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් උපාධියක් සමඟ රජය විසින් පිළිගත් ආයතනයකින් ශාරීරික අධ්‍යාපනය / ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් උපාධියක් සමඟ උපාධියක් ලබා ගැනීමට පෙර අවුරුදු 08 ක් තුල ජාතික මට්ටමේ කේවල ක්‍රීඩා ඉසව්වකින් ප්‍රථම ස්ථානය/දෙවන ස්ථානය/ තුන්වන ස්ථානය දිනා තිබීම හෝ පළාත් මට්ටමේ ක්‍රීඩා තරඟයකින් ප්‍රථම ස්ථානය දිනා තිබීම හෝ අන්තර්ජාතික මට්ටමේ පිළිගත් ක්‍රීඩා තරඟාවලියක කේවල ක්‍රීඩා තරඟයකට සහභාගී වී තිබීම. |
| 27 | ද්විභාෂාවෙන් (සිංහල හා ඉංග්‍රීසි) | ව්‍යවසායකත්ව අධ්‍යාපනය (Enterpreneurship Education) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් ව්‍යාපාර පරිපාලනවේදී (BBA) උපාධියක් තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් වාණිජවේදී (B.Com) උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>වානිජ්‍යය විෂයය ධාරාව යටතේ අ.පො.ස.(උ.පෙළ) හදාරා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් ව්‍යාපාර කළමනාකරණය (BBM) පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| 28 | ද්විභාෂාවෙන් (දෙමළ හා ඉංග්‍රීසි) | ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය (Business and Accounting studies) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් වාණිජවේදී (B.Com) හෝ මූල්‍ය සහ ගිණුම්කරණය (B.Sc. Finance & Accounting) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගිණුම්කරණය ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ලබාගත් උපාධියක් තිබීම. |

එම්.වයි.සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
ත්‍රිකුණාමලය.

**EX/Rec/18/08**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාතේ පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

**විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය** ☐
සිංහල - S   දෙමළ - T
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)*

**විභාගයට ඉදිරිපත් වන නගරයේ අංකය** ☐
*(10 වැනි ඡේදයේ සඳහන් නගර අංකය ලියන්න.)*

**ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය** : ..............................................................

**දිස්ත්‍රික්කය තුළ පදිංචි කාලසීමාව(අවුරුදු)** : ........................

ඉල්ලුම් කරනු ලබන විෂයය : (උපලේඛන 02 අනුව යොදන්න)

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |

අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක : 1. ..................................................
(උපලේඛන 01 අනුව යොදන්න) 2. ..................................................

---

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ..................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................................................................................

1.3 සම්පූර්ණ නම : ..........................................................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..........................................................................................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය   ස්ත්‍රී - F   පුරුෂ - M ☐
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ..........................................................................................................

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ..........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................................................................................

2.2 ස්ථිර ලිපිනය : ..........................................................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..........................................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................................................................................

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 **2019.01.04** දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** ජනවර්ගය : සිංහල ☐ ශ්‍රී ලාංකික දෙමළ ☐ මුස්ලිම් ☐ වෙනත් ☐
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

**5.0** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ............................................
(ii) විභාග අංකය : ............................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ............................................
(ii) විභාග අංකය : ............................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

5.3 උපාධිය පිළිබඳ විස්තර

5.3.1 උපාධිය : ..............................................................................................................

5.3.2 විශ්ව විද්‍යාලය/ ආයතනයේ නම: .....................................................................................

5.3.3 උපාධිය වලංගු වන දිනය: ...............................................................................................

5.3.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන්: .........................................................................

5.3.5 උපාධි වර්ගය : අභ්‍යන්තර ( ) බාහිර ( ) *(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

5.4 ඩිප්ලෝමාව පිළිබඳ විස්තර

5.4.1 ඩිප්ලෝමාව : ...........................................................................................................

5.4.2 ආයතනයේ නම: ..........................................................................................................

5.4.3 ඩිප්ලෝමාව වලංගු වන දිනය: ...........................................................................................

5.4.4 ඩිප්ලෝමා කාල සීමාව : ..................................................................................................

**6.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

6.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : .........................................................................

6.2 වර්තමාන තනතුර : .........................................................................

6.3 තනතුරෙහි ස්ථිර කළ දිනය : .........................................................................

6.4 මුල්පත්වීම් දිනය : .........................................................................

**7.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ..........................................................................................................

**8.0** විභාග ගාස්තු ගෙවූ (පැහැදිලි විස්තර සහිත) ලදුපත අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

**9.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ........................................ ..........................................

අයදුම්කරුගේ අත්සන

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 3.5 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

දිනය : ................................ ........................................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම: .....................................................................

තනතුර : ...........................................................................

ලිපිනය : ...........................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(රජයේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියෙකු වශයෙන් ................................. තනතුරෙහි සේවය කරන ................................................ මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය තම සේවා කාලය තුළ කිසිදු විනයානුකූල කටයුත්තකට භාජනය නොවූ බවත්, සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මෙහි ඔහු/ඇය විසින් සඳහන් කර ඇති විස්තර ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

දිනය : .............................. ........................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ...........................................................................

පදවි නාමය : ...........................................................................

ලිපිනය : ...........................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)